සියලු හිමිකම් ඇවිරිනි

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

පිටු ගණන: 10

# විධායක අදියර I

# KE 3 Fundamentals of Taxation

## (පෙරහුරු ප්‍රශ්න පත්‍රය)

K E 3

**<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>**

(1) වෙන්කර ඇති කාලය : කියවීමට සහ සැලසුම් කරගැනීමට – විනාඩි 10
පිළිතුරු සැපයීමට – විනාඩි 90

<u>A – කොටස – බදුකරණයේ මූලිකාංග</u>

1(අ) ප්‍රශ්නය : බහුවරණ ප්‍රශ්න 5 ක් (MCQs) – **සියළු ප්‍රශ්න අනිවාර්යයි.**

1(ආ) ප්‍රශ්නය : බහුවරණ ප්‍රශ්න 5 ක් – **සියළු ප්‍රශ්න අනිවාර්යයි.**

2 ප්‍රශ්නය : එක් කුඩා (Mini scenario) ප්‍රශ්නයක් – **අනිවාර්ය ප්‍රශ්නයකි.**

3 ප්‍රශ්නය : එක් විශාල ප්‍රශ්නයක් – **අනිවාර්ය ප්‍රශ්නයකි.**

(2) 1(අ) ප්‍රශ්නය සඳහා සපයනු ලබන විශේෂ කඩදාසියේ පිළිතුරු සැපයිය යුතුය. එහිදී සපයා ඇති (A, B, C සහ D) යන පිළිතුරු වලින් වඩාත්ම නිවැරිදි පිළිතුර තෝරා අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අදාළ පිළිතුරු අක්ෂරය සඳහන් කළ යුතය.

(3) ඉතිරි සියළුම ප්‍රශ්න වලට පිළිතුරු, ඔබට සපයන පිළිතුරු පොතහි සැපයිය යුතුය. 2 වැනි සහ 3 වැනි ප්‍රශ්නවල පිළිතුරු පොතෙහි නව පිටුවකින් ආරම්භ කළ යුතුය.

**(4)** සියළුම ප්‍රශ්න වලට පිළිතුරු එක් භාෂාවකින් පමණක් සැපයිය යුතු අතර එම භාෂාව ඔබ **අයදුම් කර ඇති භාෂාව විය යුතුය.**

# 1 කොටස

| |
|---|
| *සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.* |
| *මෙම කොටසට ලකුණු 20 ක් හිමිවේ.* |
| *මෙම කොටසට නියමිත කාලය විනාඩි 36 කි.* |

**ප්‍රශ්න අංක 01**

**1(අ):** වඩාත්ම උචිත පිළිතුර තෝරා එම පිළිතුරු අක්ෂරය පිළිතුරු පත්‍රිකාවේ සටහන් කරන්න.

**(මුළු ලකුණු 10)**

1.1. බදුකරණයේ වඩාත් නිවැරිදි මූලිකාංගයන් වනුයේ ඃ

A. සාධාරණත්වය, ක්‍රමානුකූල වර්ධන බව, සරලබව, නිශ්චිත බව.

B. ආර්ථිකමයබව, ප්‍රතිඵලදායී බව, නිශ්චිත බව, කාර්යක්ෂම බව.

C. සාධාරණත්වය, ක්‍රමානුකූල වර්ධන බව, සාධාරණබව, වියදම් ප්‍රතිඵලදායී බව.

D. කාර්යක්ෂම බව, ප්‍රතිඵලදායීබව, ක්‍රමානුකූල වර්ධනභාවය, විනිවිදභාවය.

**(ලකුණු 2)**

1.2. දේශීය ආදායම් පනතේ ප්‍රතිපාදන අනුව වාසික පුද්ගලයකුගේ තක්සේරුවන ආදායමෙහි කොටසක් වනුයේ පහත දැක්වෙන කුමන ආදායම් හෝ ලැබීම්දැයි හඳුනාගන්න.

A. වාණිජ්‍ය බැංකුවක පවත්වාගෙන යන NRFC ස්ථාවර තැන්පතුවක් සඳහා සිංගප්පූරු ඩොලර් 1,000 ක් වූ පොලී මුදලක්.

B. වාණිජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ස්ථාවර තැන්පතුවක් සඳහා 2.5% ක් වූ අත්හිටවූ බදු වලින් පසුව ලැබුණු රු. 420,000 ක්වූ ශුද්ධ පොලී ආදායම.

C. නුවර පිහිටි වාසස්ථානයක් කුලියට දීම වෙනුවෙන් ලැබුනු රු. 1,800,000 ක් වූ ශුද්ධ ආදායම.

D. ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වන ලද ලොතරැයියකින් ලද දිනුමක් වෙනුවෙන් අදාල අත්හිටවූ බදු අයකරගැනීමෙන් පසුව ලැබුණු රු. 900,000 ක් වූ ශුද්ධ ත්‍යාග මුදල.

**(ලකුණු 2)**

1.3.දුම්කොල ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයක යෙදී සිටින හෙලදිව ක්‍රියේෂන්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් හෙලදිව ගෲප් හි උප සමාගමකි. අදාල වර්ෂය තුළදී මෙම සමාගම රුපියල් 380,000,000 ක් වටිනා නිෂ්පාදන අලෙවිකර ඇත. පහත දැක්වෙන ආදායම් බදු ප්‍රතිශතයන්ගෙන් මෙම සමාගමට අදාල වන බදු ප්‍රතිශතය කුමක්වේද ?

A. 10%

B. 12%

C. 28%

D. 40%

**(ලකුණු 2)**

1.4.තක්සේරු වර්ෂය 2015/2016 සඳහා වූ ආදායම් බදු ගෙවිය යුතු අවසන් දිනය සහ ආදායම් බදු වාර්තාව ගොනුකළ යුතු අවසන් දිනය පිලිවෙලින් පහත දැක්වෙන කුමන ප්‍රකාශයෙහි දක්වා ඇත්දැයි **සඳහන් කරන්න.**

A. 2016 මැයි 15 සහ 2016 සැප්තැම්බර් 30 දින හෝ ඊට පෙර.

B. 2016 මැයි 15 සහ 2016 නොවැම්බර් 30 දින හෝ ඊට පෙර.

C. 2016 සැප්තැම්බර් 30 සහ 2016 නොවැම්බර් 30 දින හෝ ඊට පෙර.

D. 2016 නොවැම්බර් 30 සහ 2016 නොවැම්බර් 30 දින හෝ ඊට පෙර.

**(ලකුණු 2)**

1.5.කමල් එන්ටර්ප්‍රයිසස් හි 2016 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුවෙහි පිරිවැටුම, තීන්ත නිෂ්පාදන ව්‍යවසායයෙන් රු. 2,400,000 ක් සහ තීන්ත භාජන නිෂ්පාදන ව්‍යවසායයෙන් රු. 1,400,000 ක් ලෙසින් විය. කමල් එන්ටර්ප්‍රයිසස් හි ජාතිය ගොඩනැගීමේ බදු (NBT) සඳහා 2016 මාර්තු 31 න් අවසන් කාර්තුව සඳහා වූ පිරිවැටුම වූයේ:

A. රු. 3,800,000

B. රු. 2,400,000

C. රු.1,300,000

D. රු.1,200,000

**(ලකුණු 2)**

**1(ආ):**කාර්ය හඟවන ක්‍රියාපද (Action Verb Checklist) කෙරෙහි අවධානය යොමු පිළිතුරු හෝ කෙටි ගණනය කිරීම් ලියන්න.

**(මුළු ලකුණු 10)**

1.6. ශ්‍රී ලංකාවේ වත්මන් බදු පද්ධතිය අනුව රාජ්‍ය දෙපාර්තමේන්තු රැසක් විවිධ බදු අයකර ආයතන ලෙසින් ක්‍රියාත්මක වේ.

**අවශ්‍ය වන්නේ:**

ඔබ විසින් ශ්‍රී ලංකාවේ බදු රැස්කරන බලධාරී ආයතන **හතරක් (4) සඳහන් කරන්න.**

**(ලකුණු 2)**

1.7. අජිත් වනිගසිංහ මහතා වර්ෂ 2014 ජුනි මසදී නව නිවසක් තනා නිමකර වහාම මසකට රු. 25,000 ක්වූ කුලියකට වසර 3 ක කාලයක් සඳහා කුලියට දෙන ලදී. පලාත් පාලන ආයතනය විසින් එම නිවස වරිපනම් අයකිරීමේ කාර්ය සදහා රු. 200,000 ක්වූ අගයකට තක්සේරු කරන ලදී. ඔහු 30% ක් බැගින් වූ වරිපනම්ද, නිවසේ ජල බැසීම් පද්ධතිය අලුත්වැඩියා කිරීම පිණිස වූ රු. 128,000 ක මුදලක්ද 2015/16 තක්සේරු වර්ෂය තුළදී දරණ ලදී.

**අවශ්‍ය වන්නේ:**

ඔබ විසින් තක්සේරු වර්ෂ 2015/16 සඳහා වූ මෙම නිවාස හිමිකරුගේ කුලී ආදායම **ගණනය කරන්න.** **(ලකුණු 2)**

1.8. තක්සේරු වර්ෂ 2011/12 හිදී රු. 2,000,000 කට කුලී ප්‍රවාහන සදහා භාවිතා කිරීම පිණිස ග්ලෝබ්ල් ට්‍රැවල්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් විසින් මිලදීගත් ලොරි රථයක් 2015/16 තක්සේරු වර්ෂය තුලදී රු. 520,000 කට විකුණන ලදී.

**අවශ්‍ය වන්නේ:**

ආදායම් බදුකරණය සඳහා වූ ලොරි රථ අලෙවි ලාභය **ගණනය කරන්න.**

**(ලකුණු 2)**

1.9. 2015.02.15 දිනදී සමරදිවාකර මහතාට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් හිඟබදු දැනුම්දීමක් ලැබුණු අතර ඔහු එම දැනුම්දීමට එකඟ නොවේ.

**අවශ්‍ය වන්නේ:**

හිඟබදු අයකර ගැනීමට දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාට ගත හැකි පියවරයන් දෙකක් (2) **සඳහන් කරන්න.**

**(ලකුණු 2)**

1.10. සුප්‍රීම් ඉන්ඩස්ට්‍රීස් 2015.12.31 න් අවසන් කාර්තුව තුළදී ඇල්පා සහ බීටා නැමැති නිෂ්පාදිත දෙක නිෂ්පාදනය කරන ලදී. බීටා නැමැති නිෂ්පාදිතය එකතුකල අගය මතවූ බදු වලින් නිදහස් භාණ්ඩයක් වේ.

සැපයුම් වටිනාකම – ඇල්ෆා රු. 4,500,000

සැපයුම් වටිනාකම – බීටා රු. 1,500,000

නිෂ්පාදිත දෙකම නිපදවීම සඳහාවූ මිලදීගැනීම් මත ගෙවන ලද එකතුකළ අගය මතවූ බදු මුදල රු . 360,000 කි.

සැපයුම්කරුවකුගෙන් ලද බැර පත්‍රිකාවක අන්තර්ගතවූ එකතුකළ අගය මතවූ බදු කොටස රු. 30,000 ක් විය.

**අවශ්‍ය වන්නේ :**

වර්ෂ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වු කාර්තුව සඳහා ගෙවිය යුතු එකතුකළ අගය මතවූ බදු මුදල, උක්ත තොරතුරු ආශ්‍රයෙන් **ගණනය කරන්න.**

**(ලකුණු 2)**

# 2 කොටස

| |
|---|
| *අනිවාර්ය ප්‍රශ්නයකි.* |
| *මෙම ප්‍රශ්න 2 සඳහාවූ මුළු ලකුණු ප්‍රමාණය 10 කි.* |
| *මෙම කොටසට නියමිත කාලය විනාඩි 18 කි.* |

**ප්‍රශ්න අංක 02**

කාර්ය හඟවන ක්‍රියාපද (Action Verb Checklist) කෙරෙහි අවධානය යොමු කරමින් පහත ප්‍රශ්නය සඳහා ගණනය කිරීම් කර ඉදිරිපත් කරන්න.

**(ලකුණු 10)**

නොමෑඩ් සමාගම් සමූහයෙහි උප සමාගමක් වන නොමෑඩ් මැනුෆැක්චර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ පිහිටුවා ඇති අතර එය සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනයෙහි යෙදී සිටී. තක්සේරු වර්ෂ 2015/16 තුළදී මෙම සමාගම රු. 260,000,000 ක නිෂ්පාදන සෙල්ලම් භාණ්ඩ දේශීය වෙළඳපොලටත් අලෙවිකළ අතර රු. 240,000,000 ක් භාණ්ඩ නිර්යාත කරඇත. ඔබට පහත දක්වන තොරතුරු සපයා ඇත.

- තක්සේරු වර්ෂ 2015/16 තුළදී නොමෑඩ් මැනුපැක්චර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් ලබන ලද ව්‍යාපාරික ව්‍යවස්ථාපිත ලාභය රු. 100,000,000 ක් වූ අතර ඉන් රු. 40,000,000 ක් නිර්යාත ව්‍යාපාර කටයුත්ත තුළින් උපදවා ඇත.

- සමාගම තක්සේරු වර්ෂ 2015/16 තුළදී පහත දක්වන අනිකුත් ආදායම් උපදවා ගෙන ඇත.

| **අයිතම** | **රු.** |
|---|---:|
| ස්ථාවර තැන්පතු මත වූ පොලී ආදායම (ශුද්ධ) | 180,000 |
| භාණ්ඩාගාර බිල්පත් මත වූ පොලී ආදායම | 45,000 |
| ලාභාංශ ආදායම (ශුද්ධ) | 90,000 |
| ආදායම් බදු නිදහස් ලාභාංශ ආදායම් | 50,000 |

- අහිතකරකාරී වෙළඳපොළ තත්ත්වය යටතේ තක්සේරු වර්ෂ 2015/16 තුලදී සමාගමට, සමාගම් කොටස් අලෙවියෙන් රු. 800,000 ක අලාභයක් සිදුවිණ.

- තක්සේරු වර්ෂ 2015/16 තුලදී සමාගම පහත දක්වන ගෙවීම් සිදුකරන ලදී.

| **අයිතම** | **රු.** |
|---|---|
| නව කර්මාන්ත ශාලා ගොඩනැගිල්ල ඉදිකිරීම පිණිස ලංකා බැංකුවෙන් ලබාගත් ණය මුදල වෙනුවෙන් ගෙවූ වාරික මුදල් (මෙම මුදලෙහි ණය ප්‍රාග්ධන මුදල් ආපසු ගෙවීම් රු. 1,200,000 ක්ද ඇතුලත් වේ.) | 2,400,000 |
| රෝගී සහ දිලිඳු පුද්ගලයන් සඳහා ආයතනිකමය රැකවරණ සැලසීම වෙනුවෙන්වූ අනුමත පුන්‍යායතනයකට කරන ලද මුදල් පරිත්‍යාග. | 750,000 |
| "අපි වෙනුවෙන් අපි" අරමුදල වෙනුවෙන් කරන ලද සිමෙන්ති පරිත්‍යාගය | 400,000 |
| ස්ව-තක්සේරු ආදායම් බදු ගෙවීම්-(තක්සේරු වර්ෂ 2015/16 වෙනුවෙන්) | 18,000,000 |

- නොමෑඩ් මැනුෆැක්චර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් තක්සේරු වර්ෂ 2014/15 දී උපදවන ලද ලාභයෙන් එහි කොටස් හිමියන් වෙතට රු. 5,000,000 ක ලාභාංශයක් 2015.04.10 දින ප්‍රකාශ කරන ලද අතර ඒ මතවූ ලාභාංශ බද්ද 2015.04.30 දින ගෙවන ලදී.

**අවශ්‍ය වන්නේ:**

ඔබ විසින් තක්සේරු වර්ෂ 2015/16 සදහා නොමෑඩ් මැනුෆැක්චර්ස්(ප්‍රයිවට්) ලිමිටඩ් දළ ආදායම් බදු වගකීම සහ තවදුරටත් ගෙවිය යුතු ඉතිරි ආදායම් බදු මුදල **ගණනය කරන්න.**

**(ලකුණු 10)**

# 3 කොටස

| |
|---|
| *අනිවාර්ය ප්‍රශ්නයකි.*<br>*මෙම 3 වැනි ප්‍රශ්නය  සඳහා වූ මුළු ලකුණු ප්‍රමාණය 20 කි.*<br>*මෙම කොටසට නියමිත කාලය විනාඩි  36 කි.* |

**<u>ප්‍රශ්න අංක 03</u>**

| |
|---|
| කාර්ය හඟවන ක්‍රියාපද (Action Verb Checklist) කෙරෙහි අවධානය යොමු කරමින් පහත ප්‍රශ්නය සඳහා ගණනය කිරීම් කර ඉදිරිපත් කරන්න.<br>**(ලකුණු 20)** |

වාණිජ ව්‍යාපාර ආයතනයක සේවය කරන උත්පල පෙරේරා මහතා ඉංජිනේරුවරයෙකි. 2016/03/31 න් අවසන් වර්ෂය සදහා වූ ඔහුගේ ලැබීම් සහ ගෙවීම් සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

**<u>සේවා නියුක්ති ආදායම</u>**

| **අයිතම** | **රු.** |
|---|---:|
| ශුද්ධ වැටුප (පහත දැක්වන සටහන බලන්න) | 1,340,000 |
| 12%  සේවක අර්ථසාධක අරමුදල් | 180,000 |
| උපයන විට ගෙවීම් (PAYE) | 40,000 |

***සටහන :*** *අර්ථසාධක අරමුදල් සදහා වූ අදාළ දායකත්වය සහ උපයනවිට ගෙවීම් අඩුකිරීමෙන් අනතුරුව ශුද්ධ වැටුප ගණනය වී ඇත.*

උක්ත වැටුපට අමතරව සමාගම ඔහුට රු.50,000 ක උත්සව දීමනාවක් 2015 දෙසැම්බර් වලදී ගෙවන ලද අතර 2016 මාර්තුවලදී ඔහුගේ වයස අවුරුදු 10 ක් වූ බාලවයස්කාර පුතාගේ වෛද්‍ය බිල් ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීමක් ලෙසින් රු. 60,000 ක් ඔහුට ලැබුණි.

උත්පල පෙරේරා මහතා තම සේවාදායක සමාගම විසින් ලබාදී ඇති නිවසක පදිංචි වී සිටී. සමාගම එම නිවස සදහා රු. 25,000 ක මාසික කුලියක් නිවාස හිමිකරුට ගෙවනු ලැබේ. එම නිවසේ වරිපනම් තක්සේරුව රු. 200,000 ක්ද වරිපනම් 20% බැගින්ද වේ.

**<u>වෘත්තීය සේවා සැපයීම්</u>**

නිවාඩු දිනවල ඔහු විසින් ස්වාධීන වෘත්තීය සේවා සැපයීම් සිදුකෙරෙන අතර එමගින් රු. 600,000 ක් ලාභයක් මෙම වසරහිදී උපයාගෙන ඇත. එම ලාභ ගණනයේදී ඔහු විසින් පහත වියදම් අඩුකරගෙන ඇත.

| වියදම් | රු. |
|---|---|
| සහායකයන්ට කළ වැටුප් ගෙවීම් | 240,000 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය | 50,000 |
| ප්‍රවෘත්ති පත්‍ර දැන්වීම්. | 60,000 |
| පරිගණකයක් මිලදී ගැනීම | 80,000 |
| සේවාදායකයන්ට කරන ලද සංග්‍රහ වියදම් | 20,000 |
| ක්ෂයවීම් | 32,000 |
| විදුලිය සහ දුරකථන | 80,000 |

සහායක වැටුප් තුළ වාර්ථා සැකසීම වෙනුවෙන් තම බිරිඳට ගෙවූ රු. 150,000 ක මුදලක්ද ඇතුලත් වේ.

ප්‍රචාරණ වියදම් තුළ සේවක ඇබෑර්තු පිරවීම පිණිසවූ දැන්වීමක් සඳහාවූ රු. 12,000 ක වියදමක්ද ඇතුලත් වේ.

නිවසේ සමස්ථ විදුලි හා දුරකථන බිල් වෘත්තීය සේවා ලාභ ගණනයේදී වියදමක් සේ සලකා ඇති අතර එම මුළු වියදමින් 20% ක් පමණ වෘත්තීය සේවා ව්‍යාපාරයට අදාළ වේයැයි ඇස්තමේන්තු කර ඇත.

මෙම වසර තුළ මිලදී ගත් පරිගණකයට අමතරව 2013/14 වර්ෂයේදී රු. 60,000 කට මිලදීගත් කාර්යාල මේසයක් සහ පුටු කිහිපයක්ද වෘත්තීය සේවා ව්‍යාපාරයේ යොදවා ඇත.

**වෙනත් ආදායම් පහතාකාරයෙන් සමන්විත වේ.**

| අයිතම | රු. |
|---|---|
| ස්ථාවර තැන්පතු සදහාවූ පොලී ආදායම් (ශුද්ධ) | 276,000 |
| භාණ්ඩාගාර බිල්පත් මතවූ පොලී ආදායම් | 90,000 |
| පුතාගේ බැංකු තැන්පතුව මත ලැබූ පොලී ආදායම් (දළ) | 45,000 |
| කොටස් අලෙවියෙන් ලද ලාභ | 300,000 |

ඔහුට නුගේගොඩ නිවසක් ඇති අතර 2015 ජනවාරි 01 දින සිට රු. 50,000 ක මාසික කුලියකට, කුලියට දී ඇ. ව.අඩි. 1,800 ක වපසරියකින් සමන්විත මෙම ගෙය 2014 වර්ෂයේදී තැනීම් නිමකර ඇත. මෙහි වරිපනම් තක්සේරුව රු 200,000 ක් වන අතර වරිපනම් 30% ක් වේ.

උත්පල පෙරේරා මහතාට රු. 20,000 ක දළ ලාභාංශයක් , නැෂනල් යුනිට් ට්‍රස්ට් වලින්ද, ටොයෝටා ලංකා සමාගමින් රු. 63,000 ක ශුද්ධ ලාභාංශයක්ද මෙම වසර තුළදී ලැබුනි.

**<u>ගෙවීම්</u>**

නිවාස ණය මත සහ බැරපත්‍ර මත ගෙවූ පොළී පිළිවෙලින් රු. 123,000 ක් සහ රු. 18,000 ක් වේ.

ඔහු විසින් ජාතික පාසැලක පරීක්ෂණාගාරයක් තැනීම පිණිස රු. 100,000 ක් ආධාර මුදලක්ද, රෝගී සහ දිලිඳු පුද්ගලයන් සඳහා ආයතනිකමය රැකවරණ සැලසීම වෙනුවෙන් වූ අනුමත පුණ්‍යායතනයකට රු. 80,000 ක මුදලක්ද පරිත්‍යාග කරන ලදී.

සුවකළ නොහැකි රෝගයන් ආවරණය කරන ලද විශේෂ වෛද්‍ය රක්ෂණ ඔප්පුවක් වෙනුවෙන් රු. 48,000 ක රක්ෂණ වාරික මුදලක් ගෙවන ලදී.

2015/2016 වසර වෙනුවෙන් රු.40,000 ක ස්වතක්සේරු බදු වාරිකයන් ගෙවන ලදී.

> **අවශ්‍ය වන්නේ :**
>
> ඔබ විසින් උත්පල පෙරේරා මහතාගේ තක්සේරු වර්ෂ 2015/16 සඳහා වූ සමස්ථ ව්‍යවස්ථාපිත ආදායම, තක්සේරු කළහැකි ආදායම, බදුකළ හැකි ආදායම, දළ ආදායම් බදු වගකීම සහ ගෙවිය යුතු ඉතිරි ආදායම් බදු මුදල **ගණනය කරන්න.**
>
> **(මුළු ලකුණු 20)**